# වික්ටෝරියානු කුහකත්වය හා ඉංගිරිසි රජ පවුල

අප මෙතෙක් සාකච්ඡා කෙළේ ලංකාවේ පැවති විවාහය පිළිබඳව ය. එහි දී අපට වැදගත් වන්නේ ඒක භාර්යා ඒක පුරුෂ විවාහයක් සාධාරණ වශයෙන් මෙරට වු බවත්, පවුල අද මෙන් න්‍යෂ්ටික නොව විස්තෘත වු බවත්, විවාහය අවලංගු කිරීම රොබට් නොක්ස් සිතූ ආකාරයට ලිහිල් නොවු බවත් ය. මේ සියළු කරුණු පිටුපස ඇත්තේ මෙරට එදා පැවති චින්තනය කුමක් ද යන්න ය. චින්තනය යන්නට ආකල්ප ද ඇතුළත් වෙයි. එබැවින් එකල සමාජයේ පැවති ආකල්ප ද අපට වැදගත් වෙයි.

විවාහය විස්තෘත පවුලක සාමුහිකත්වයෙන් බැඳුණු එකක් වීමත් දරුවන් එහි ප්‍රධාන කාර්යයක් ඉටුකිරීමත්, දරුවන් හදාවඩාගැනීම හුදෙක් දෙමව්පියන්ගේ පමණක් කාර්යයක් නොවීමත් ආදිය නොසලකා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දෙදෙනකුගේ පෞද්ගලික කැමැත්ත මත ඉන්ද්‍රියන් පිනවීම ද මුල්කරගෙන න්‍යෂ්ටික පවුලක සිදුකෙරෙන විවාහය සමග ලංකාවේ පැවති විවාහය සංසන්දනය කළ නො හැකි ය. එමෙන් ම ලංකාවේ විවාහය බටහිර ආකාරයෙන් ලියා පදිංචිකිරීමක් නොවීය යන්නෙන් විවාහයක් නිත්‍යානුකූල නොවීය යන්නක් ද ගම්‍ය නො වෙයි.

ලංකාවේ විවාහය සිදුකෙරුණේ හුදෙක් සාක්ෂිකරුවන් දෙදෙනකු පමණක් ඉදිරියේ නොව ඇතැම් විට මු ගමක් ඉදිරියේ ය. විවාහයක් අවලංගුකිරීම ද එසේ ම ජන සමුහයක් මැද සිදු විය. එලෙසම විවාහය දෙදෙනකුගේ පෞද්ගලික කටයුත්තක් පමණක් නොවීම ද මෙහි දී වැදගත් විය. විවාහය පෞද්ගලික කටයුත්තක් පමණක් වී නම් යම් හේතුවක් නිසා දෙදෙනාට දෙදෙනා නොපෑහේය යන කරුණ උඩ විවාහය අවලංගු කිරීමේ ඉඩකඩ ඇත. බටහිර සිදුවන්නේ එය ය. එහෙත් ලංකාවේ විවාහයක් අවලංගුකිරීම එසේ යුවළගේ කැමැත්ත මත පමණක් කිරීමේ ඉඩකඩක් නො වී ය. පවුල් දෙකක් සම්බන්ධ වු විවාහයක වගකීම ඒ පවුල් විසින් දරණ ලදී. මෙහි දී පවුල යන්න විස්තෘත පවුල ලෙස ගත්විට එහි බරපතලකම වැටහෙයි.

රොබට් නොක්ස් විවාහය අවලංගුකිරීම සම්බන්ධයෙන් දක්නට ඇත්තේ එහි අවසාන පියවර මිස එකම පියවර නොවන බව පැහැදිලි ය. කලින් කතිකාකරගත් විවාහ අවලංගුකිරීමක් අවසාන පියවරෙහි දී පිරිසක් මධ්‍යයෙහි ඒ ප්‍රකාශකිරීමෙන් ඒ ක්‍රියාවලියෙහි ලිහිල් බවක් ගම්‍ය නො වෙයි. එදා විවාහයක් අවලංගුකිරීමෙහි දී එකිනෙකාගේ අයිතීන් නොව දරුවන් හා එකිනෙකා කෙරෙහි දැක්වූ යුතුකම හා වගකීම් සැලකිල්ලට ගැණිනි.

මේ සියල්ලෙන් පෙනී යා යුත්තේ එකල ලංකාවේ පැවති විවාහය වගකීමක් බරක් පතළක් නැති සංස්ථාවක් නොව සාමුහිකත්වය මත පදනම් වු යුතුකම් හා වගකීම් සහිත එකක් වු බව ය. එබැවින් කිසිවකුටවත් එදා පැවතියේ හුදු පෞද්ගලික ඉන්ද්‍රිය පිනවීම් වස් එක් එක් පිරිමියා අවශ්‍ය පරිදි ඇතැම් සතුන් මෙන් එක් එක් ස්ත්‍රිය සමග ඇතිකරගත් සම්බන්ධකමක් යැයි කිවහැකි නො වෙයි. අද ඇතැම් උගතුන් සූදානම් වන්නේ රොබට් නොක්ස් නම් නැවක සේවය කළ තරුණයකු ලියූ වාක්‍යයක් ආශ්‍රයෙන් එකල ඉතා ලිහිල් විවාහයක් තිබූ බව පෙන්වීමට ය.

අපේ ප්‍රස්තුතයට කෙලින් ම අදාළ නොමැති වුවත් බටහිර ධනපති ක්‍රමය යටතේ විවාහය වෙළෙඳ භාණ්ඩයක් වී ඇතැයි යන උගතුන්ගේ කියමන ද සලකා බැලිය යුතු ය. මෙයින් මේ උගතුන් කීමට අදහස්කරන්නේ විවාහය දෙදෙනකුගේ ප්‍රේමය හෝ වෙනත් මානුෂික කරුණක් මත කෙරෙන්නක් නොව ප්‍රාග්ධන අවශ්‍යතා මත කෙරෙන්නක් බව ය. අද බොහෝ විවාහ ප්‍රේමයක් මුල්කරගෙන සිදුවෙයි. එහෙත් ඇතැම් විට විවාහ යෝජනා මගින් සිදුවන විවාහ දෑවැද්ද, ධන ආයෝජන, දේපොළ උරුමය ආදිය ඔස්සේ කෙරෙයි. ප්‍රාග් ධනය වැඩිකිරීම සඳහ පවුල් අතර කෙරෙන විවාහ ද, මෙහි දී විවාහ විචාරකයන්ගේ අවධානයට හසුවෙයි.

එහෙත් අද ඇතැම් විචාරකයන් කියන අන්දමට නම් මුළු මහත් සමාජය ම අනෙක් කරුණුවල දී මෙන් ම ප්‍රාග්ධනය මත රැඳෙයි. „සමාජයේ ඉහළ පෙළැන්තියෙහි පවුල් කිහිපයක එවැනි විවාහ සිදුවන්නේ" යැයි කීම වරදක් නැත. එහෙත් මුළු මහත් සමාජයකට ම ඒ කරුණ ඇටවීමට කරන උත්සාහය මල් පල හටගන්නා බවක් පෙනෙන්නට නැත. සියළු විවාහ ප්‍රාග්ධනය මත පදනම් වී සිදුවන්නේ යැයි පැවසීම මගින් යමකු මාක්ස්වාදය තහවුරුකිරීමට

© Prof. Nalin De Silva

උත්සාහගන්නේ නම් එහි ඇත්තේ මුග්ධභාවය මිස අනෙකක් නො වෙයි. මෙවැනි කතාවල හෝ විවාහය හුදු ප්‍රේමය මත පදනම් වී කෙරෙන්නේ යැයි කීමෙ හෝ ඇත්තේ ඌනිතවාදය මිස අනෙකක් නො වෙයි.

විවාහයෙහි ආර්ථික පදනමක් නොවුවා නො වෙයි. පැරණි සමාජයෙහි සහකරුවකු හෝ සහකාරියක හෝ ලබාගැනීම විවාහයෙහි අරමුණක් විය. අපේ පැරැන්නන් විවාහය ගැන කීවේ සහේට ගන්නවා කියා ය. එමෙන් ම විවාහයෙහි ප්‍රේමය ද වෙයි. ඉන්ද්‍රිය පිනවීම ද විවාහයෙහි එක් අරමුණක් ලෙස පවතියි. දරුවන් හදාවඩාගැනීම විවාහයෙහි තවත් අරමුණක් වෙයි. විවිධ සමාජවල මෙවැනි අරමුණු අඩු වැඩි වශයෙන් තිබී ඇත. එකල පමණක් නොව අද ද ලංකාවෙහි විවාහය යනු මේ සියල්ලට අමතරව පවුල් දෙකක් අතර වූ එකතුවකි. අද බටහිර සමාජයෙහි විවාහය කඩාවැටෙමින් පවතියි. එයට ප්‍රධාන හේතුව විවාහයක් යනු පවුල් දෙකක් අතර නොව දෙදෙනකු අතර එකතුවක් ලෙසවත් සැලකීමට අද ඔවුන්ට ක්‍රමයෙන් නොහැකි වී තිබීම ය.

පසුගිය සියවස් පහක පමණ කාලයක බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පෞද්ගලිකත්වය ඉස්මතුවීමෙහි ප්‍රතිඵලය වී ඇත්තේ විවාහය පමණක් නොව න්‍යෂ්ටික පවුල ද කඩාවැටෙමින් පැවතීම ය. අද බටහිර සමාජය පරමාණුකරනය (atomization) වී ඇත. ඇතැම් පශ්චාත්මාක්ස්වාදීන් අද සමාජය යනුවෙන් දෙයක් නැතැයි කීමට පෙළඹී ඇත්තේ මේ පරමාණුකරනය හේතුකොටගෙන ය. අද සමාජයක් නැත්නම් සමාජවිද්‍යාවක් යනුවෙන් ක්ෂෙත්‍රයක් නොපැවතියහැකි බවත් සමාජවිද්‍යාඥයන් සිටිය නොහැකි බවත් සමාජවිද්‍යාඥයන් ම පිරිසක් වූ පශ්චාත්මාක්ස්වාදීන්ට නොවැටහෙන්නේ එසේ වුවහොත් ඔවුන්ගේ පැවැත්ම මෙන් ම ඔවුන් සමාජය ගැන ලියන කියන දේ ද ප්‍රතික්ෂෙපකිරීමට සිදුවන නිසා වියහැකි ය. ඒ කෙසේ වෙතත් මෙය දිර්ඝ වශයෙන් සාකච්ඡා කළයුතු කරුණකි.

පැරණි ලංකාවේ විවාහය පිළිබඳ ව සාකච්ඡාකිරීමට අප පෙළඹුණේ අද සිංහලයන් අතර ඇත්තේ වික්ටෝරියානු කුහක සදාචාරයක් බවත් පැරණි සමාජයෙහි එවැන්නක් නොතිබූ බවත් එහි විවාහය ඉතා ලිහිල් ව බැඳුණු එකක් බවත් ඇතැම් උගතුන් කියා සිටීම හේතුවෙනි. එහෙත් පැරණි සමාජයෙහි පතිව්‍රත්තය හා පතිනිව්‍රත්තය පැවතීම ආදිය මගින් කියැවෙන්නේ වෙනත් ම කතාවක් බව මේ උගතුන් අමතක කරන්නේ වික්ටෝරියානු කුහකත්වය කෙසේ වෙතත් තමන්ගේ කුහකත්වය ප්‍රදර්ශනය කරමින් ය. සිංහල බෞද්ධ සමාජයෙහි නැතිවුව ද භාරතීය සමාජයෙහි පැවති අද ද තැනින් තැන පවතින සති පූජාව වැන්නකින් පතිව්‍රත්තය කෙතරම් තදින් ඒ සමාජයෙහි මුල් බැසගෙන තිබිණි ද යන්න පැහැදිලි වෙයි. භාරතීය සමාජයෙහි කාමසූත්‍රය වැනි ග්‍රන්ථ ලියැවුනේත් තන්ත්‍රයානය වැනි දෑ පැනනැගුනේත් ඒක පුරුෂ ඒක භාර්යා විවාහය තහවුරුකිරීමට මිස බහු පුරුෂ බහු භාර්යා හැසිරීම් උද්දීපනයකිරීමට නො වෙයි.

එංගලන්තයේ වික්ටෝරියානු කුහක සදාචාරයක් ඇතිවූයේ බටහිර සිදු වූ චින්තන පෙරළියට මුහුණ දීමට එරට වැසියන්ට නො හැකිවීම නිසා ය. සාමූහිකත්වයෙන් පෞද්ගලිකත්වයට සමාජය වෙනස් වූ නමුත් පැරණි වැඩවසම් එංගලන්තයේ තිබූ ආයතන මුළුමනින් කඩා බිඳ දමා නව ආයතන ඇතිකරගැනීමට එංගලන්තයට නො හැකි විය. අඩුම තරමින් විවෘතව එසේ කිරීමට නො හැකි විය. එහි ප්‍රතිඵලය වූයේ විවාහය හා ලිංගිකත්වය පිළිබඳ පැරණි සමාජයේ තිබූ ඇතැම් ආකල්ප එලෙස ම ප්‍රසිද්ධියේ පවත්වාගෙන යෑම ය. එහෙත් අප්‍රසිද්ධියේ සමාජය නව ආකල්ප ඇතිකරගත්තේ ය. වික්ටෝරියානු කුහක සදාචාරයට මුල් වූයේ මේ පරස්පරය ය.

ප්‍රසිද්ධියේ සමාජය විවාහය හා ලිංගිකත්වය පිළිබඳ ව පැරණි ආකල්ප එලෙස ම පිළිගත්තේ ය. එහෙත් අප්‍රසිද්ධියේ සමාජය අළුත් ආකල්ප ඇතිකරගනිමින් සිටියේ ය. මෙය එංගලන්තයේ විවාහයට හා ලිංගිකත්වයට පමණක් සීමාවූවක් නො වී ය. රාජ්‍ය පාලනයේ ද එවැනි පරස්පර එංගලන්තයෙහි දැකිය හැකි ය. එංගලන්තයේ පාර්ලිමේන්තුව ක්‍රමයෙන් ශක්තිමත් වී රජුගේ බලතල නැති වූ නමුත් අදටත් නාමික ව රජපවුල මහත් උද්‍යොගයකින් පවත්වාගෙන යෑමට ඉංගිරිසිහු කටයුතුකරති.

ප්‍රසිද්ධියේ මහත් වියදමක් දරමින් රජපවුල පවත්වාගෙන ගිය ද නියම රාජ්‍ය බලය ඇත්තේ පාර්ලිමේන්තුවට මිස රජපවුලට නො වෙයි. මෙය ද එක්තරා ආකාරයක කුහකත්වයක් යැයි යමකුට කිව හැකි ය. රජපවුල යනු වත්මන් ඉංගිරිසි රාජ්‍ය පාලනයට අනවශ්‍ය වූ ආයතනයකි. එය පැරණි එංගලන්ත සමාජයට අයත්වූවකි. එහෙත් ප්‍රසිද්ධියේ

© Prof. Nalin De Silva

රජපවුල පවත්වාගෙන යෑමට ඉංගිරිසින් කටයුතුකරන්නේ වික්ටෝරියා රැජනගේ කාලයෙහි ප්‍රසිද්ධියේ පැරණි විවාහ හා ලිංගික ආකල්ප පවත්වාගෙන යමින් අප්‍රසිද්ධියේ අළුත් සමාජයට අවශ්‍ය ආකාරයෙන් අළුත් ආකල්ප පවත්වාගෙන ගිය ආකාරයට ය.

ලංකාවේ මෙවැනි තත්වයක් කිසි දිනෙක නො තිබිණි. 1831 න් පසුව කෝල්බෲක් කැමරන් ඊනියා ප්‍රතිසංස්කරණ මගින් පැරණි සමාජය කඩා බිඳ දැමීමට බ්‍රිතානීන් කටයුතු කරන තෙක් මෙරට සමාජය පැවතුනේ ගැමුණු රජුගේ ව්‍යවස්ථාවෙහි හා පරිපාලන රටාවෙහි ය. ඉන් පසුව ද විවාහය හා ලිංගිකත්වය පිළිබඳ ව පමණක් නොව වෙනත් බොහෝ කරුණු සම්බන්ධයෙන් ද බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අදහස්, ආකල්ප, සංකල්ප ආදිය සිංහලයන්ට දීමට බ්‍රිතානිහු අසමත්වූහ. ඉංගිරිසි අධ්‍යාපනයක් ලත් කිහිප දෙනකුට ඒ ආකල්ප ආදිය ලබා දුන්න ද, පොදුවේ ගත්කල සමාජය වෙනස්කිරීමට බ්‍රිතානීන්ට නො හැකි විය. මෙරට එංගලන්තය අනුකරණය කරමින් නගර කිහිපයක් ඇති කෙරුණ ද, ඒවා කිසි දිනෙක ලන්ඩන් වැනි මහ නගර නොවූවා පමණක් නොව ගම්, ගම් ලෙස ම පවත්වාගෙන යනු ලැබිණි. මේ තත්වය වෙනස්වන්නට පටන්ගත්තේ බ්‍රිතානීන් ඉංගිරිසියෙන් ලබාදුන් අධ්‍යාපනය නිදහස් අධ්‍යාපනය හා මධ්‍ය මහා විද්‍යාල ඔස්සේ ගම්වලට යෑමෙන් පසුව ය. එතෙක් නරවල පමණක් සිටි අනුකාරකයන්ට අමතර ව ඉන්පසුව ගම්වල ද අනුකාරකයෝ බිහිවූහ. අධ්‍යාපන මාධ්‍යය සිංහල වීමෙන් පසුව අනුකාරකත්වය තවත් වැඩිවිය. ඉංගිරිසින්ගේ අධ්‍යාපනය සිංහලෙන් ගම්වල ලබාදීමෙන් ගම් ක්‍රමයෙන් අභාවයට යෑමට පටන්ගත්තේ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva